# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2015 දෙසැම්බර් මස 04 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2015.12.07 දින නිකුත් කරන ලදී)**


# අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

*(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)*

**අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

## අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

*පූර්විකාව.*

“අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, ඒ පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී පදනමට සම්බන්ධ සියලු කරුණු හා පරමාර්ථ ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුයේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කිරීමට ඉල්ලීමක් කර ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2016 අංක      දරන අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.*

2. (මෙහි මින් මතු “පදනම” යනුවෙන් හඳුන්වනු ලබන) අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනමේ සාමාජිකයන් වශයෙන් දැනට සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව “අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් බවට පත්වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

2—PL 009698—225 (2016/01)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) විශේෂයෙන් වරප්‍රසාද නොලත් දිළිඳු ළමුන්ට උදව් කිරීම සහ අධ්‍යාපන පහසුකම් සැලසීම, ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, පෙර පාසල් ළමුන්ට උදව් කිරීම ද ඇතුළුව අධ්‍යාපනය සහ ක්‍රීඩා කටයුතු ප්‍රවර්ධනය කිරීම;

(ආ) ස්වකීය දුක් පීඩාවන්ගෙන් අත්මිදීම සඳහා දුබල, වැඩිහිටි සහ මානසික දුබලතා ඇති තැනැත්තන්ට උදව් කිරීම සහ ඔවුන්ට වඩා හොඳ ජීවිතයක් ගත කිරීමට සහ ඔවුන්ගේ ජීවන තත්ත්වයන් වැඩිදියුණු කර ගැනීම සඳහා උදව් කිරීම;

(ඇ) රැකියා නොමැති තරුණ තරුණියන්ට උදව් කිරීම සහ වෘත්තීය රැකියා සැපයීම, ඉඩකඩ, පුහුණුව සහ වෙනත් උපකාර සේවා සැලසීම මගින් විරැකියා තත්ත්වයට පත් තැනැත්තන්ට උදව් කිරීම සහ ඔවුන්ගේ ජීවන අභිලාශ මුදුන් පමුණුවා ගැනීමට උදව් කිරීම;

(ඈ) අඩු ආදායම්ලාභී සහ දිළිඳු පවුල්වල ජීවන තත්ත්වය නංවාලීම, ඔවුන් පුහුණු කිරීම, ඔවුන්ට ස්වයං පෝෂණය වීම සඳහා ආධාර කිරීම මෙන්ම ස්වයං රැකියා ව්‍යාපෘති වල සේවයේ යෙදීමට උනන්දු කිරීම, ඔවුන් ආර්ථික, සංස්කෘතික, සමාජ සහ ක්‍රීඩා කටයුතු සඳහා උනන්දු කිරීම, ඔවුන්ගේ ජීවන තත්ත්වයන් සහ සෞඛ්‍ය තත්ත්වයන් නගාසිටුවීම සඳහා අවස්ථා ඇති කිරීම ;

(ඉ) කර්මාන්ත සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති භාර ගැනීම සහ තම දියුණුව සඳහා වැඩසටහන් සහ ක්‍රියාකාරකම්වලට සහභාගි වන ලෙස මහජනතාව උනන්දු කිරීම;

(ඊ) ස්වභාවික ව්‍යසනවලින් සහ අනෙකුත් ස්වභාවික හේතූන් නිසා පීඩා ලැබූ සහ උන්හිටිතැන් අහිමි වූවනට උදව් කිරීම, ඔවුන්ට අවශ්‍ය දෑ සැපයීම ඔවුන්ගේ ජීවිත නැවත ඇරඹීම සඳහා උදව් කිරීම මෙන්ම වඩා හොඳ ජීවන තත්ත්වයක් ළඟා කර ගැනීමට උදව් කිරීම;

(උ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය ආනුෂංගික හෝ හිතකර යම් ක්‍රියා සහ දේ සිදු කිරීම.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණ කිරීම.**

4. (1) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ ධුර දරමින් සිටි සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පළමුවන කළමනාකරණ මණ්ඩලය සමන්විත විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උප වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, රවීන්ද්‍ර අනුර විදානගමගේ මහතා සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ ප්‍රථම සභාපතිවරයා විය යුතු ය.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, කුලියට දීමට හෝ බද්දට ගැනීමට හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීමට;

(ආ) සංස්ථාවේ කාර්යය සඳහා පොලී සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හා නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ වැසීමට;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් පාලක මණ්ඩලය විසින් සුදුසු යැයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට ;

(ඉ) දායක මුදල්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවල ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන පරිදි, යම් තැනැත්තකු හෝ යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීම;

(උ) යම් චංචල හෝ නිශ්චල දේපලක් කෙරෙහි බලපාන නීත්‍යනුකූල භාර කිසිවක් හෝ කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඌ) සංස්ථාවේ සේවකයන් සහ නිලධරයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වෙනත් සියලු දේ කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයකින් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යමක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල විය යුතු ය:— සංස්ථාවේ රීති.

(අ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, පත් කිරීම හෝ නම් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ ඔවුන්ගේ ධුර කාලය;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන

සහ රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර සහ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාම;

(ඇ) සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය, අරමුදල්වල භාරකාරත්වය සහ ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ සපුරාලීම.

(2) (1) වන උපවගන්තිය යටතේ, සාදනු ලබන කවර වුව ද රීතියක් එවැනිම රැස්වීමක දී සහ එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී ම පදනමේ බලපැවැත් වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය හැකි ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

**සංස්ථාවේ අරමුදල.**

7. සංස්ථාවේ අරමුදල :—

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ බැරට තිබුණු සියලු මුදල්වලින්; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් පසු සංස්ථාවට එකතුවන සියලු මුදල්වලින්,

සමන්විත විය යුතු ය.

**ගිණුම් සහ විගණනය.**

8. (1) සංස්ථාවේ සියලු ආදායම් හා වියදම් පිළිබඳ නිසි ගිණුම් තැබීමට සංස්ථාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සංස්ථාව විසින් පත් කරනු ලබන විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි පදනමේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් පිහිටුවනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.

**10.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව, යම් දේපලක් හෝ යම් ආදායමක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමට පෙර හෝ සංස්ථාව විසුරුවා හරින විට සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**11.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය භාරයේ තිබිය යුතු අතර, සංස්ථාවේ අනුමැතිය ඇතිව සහ සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් දෙදෙනකු, යටත් පිරිසෙයින් එක් අයකු සහ ලේකම් ඉදිරිපිට දී මිස එය කවර වූ හෝ සාධන පත්‍රයක නොතැබිය යුතුය. තව ද, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාමාජිකයන් විසින් එම සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මෙම පනතෙහි සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මඟින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන තැනැත්තන්ගේ හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳුන්වනු ලබන 431 වන අධිකාරය වන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ 13 වන වගන්තිය සංශෝධනය කරන අතර සංශෝධිත පරිදි එකී වගන්තියේ නීතියේ බලපෑම වන්නේ, නියමිත දින හෝ ඊට පසු රාජ්‍ය සේවයට ඇතුළත් වූ සහ (1) වන උපවගන්තිය යටතේ විශ්‍රාම යාමකට හෝ ඉවත් කිරීමකට පෙරාතුව වසර දහයක සේවා කාලයක් සම්පූර්ණ කොට ඇති රජයේ නිලධරයකු ඉහතකී වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රතිලාභවලට සුදුසුකම් ලැබීමට සැලැස්වීම වන්නේ ය.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිවම 27අ සහ 27ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධන කරන අතර එකී වගන්තිවල නීතියේ බලපෑම පහත දැක්වෙන පරිදිවේ එනම්—

(අ) 27අ වගන්තිය මගින්—

(අ) හදිසි නීති නියෝග යටතේ වරදක් සංයුක්ත කරනු ලබන ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් විශ්‍රාම යාමේ වයසට පෙර මිය යන රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුවන්ට සහ දරුවන්ට එකී නිලධරයා මිය ගිය දින සිට, ඔහුගේ විශ්‍රාමයාමේ දින දක්වා, ඔහු එසේ මිය ගිය දිනවන විට ලැබූ විටුපට සමාන විශ්‍රාම වැටුපක් ලැබීමටත්, එකී විශ්‍රාම යාමේ දිනයෙන් පසු මේ පනතේ විධිවිධාන අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබූමටත් හිමිකම සලසනු ලැබේ.

(2) හදිසි නීති නියෝග යටතේ වරදක් සංයුක්ත කරනු ලබන ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් සේවයේ නියුක්තව සිටිය දී මිය යන රජයේ සේවයේ අනියම් සේවකයකුගේ වැන්දඹුවට හා දරුවන්ට එකී තැනැත්තා මිය ගිය දින සිට ඔහු එසේ මිය ගිය දින වන විට ලබමින් සිටි ගෙවීමට සමාන ගෙවීමක්, ඔහු ජීවත්වූයේ නම් ඔහුට වයස අවුරුදු පනස් පහ එළඹෙන දින දක්වා ලැබීමටත්, වයස අවුරුදු පනස්පහ ඉක්ම වූ පසු, මේ පනතේ විධි විධානවලට අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමටත් හිමිකම් සලසනු ලැබේ.

(ආ) 27ආ අලුත් වගන්තිය මගින් විශ්‍රාම වැටුප් සංග්‍රහයේ ට උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිලධරයකුගේ වැන්දඹුවට එකී නිලධරයාගේ මරණින් පසු ඔහු විශ්‍රාම යාමේ දී ලබන ලද වැටුප මත ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට විධිවිධාන සලසනු ලබයි.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරන ලබන අතර සංශෝධිත පරිදි එකී වගන්තියේ නීතිය බලපෑම වන්නේ වයස අවුරුදු 26 ට අඩු ගැහැණු අනත් දරුවකුට ඇයගේ පියාගේ මරණින් පසු, ඇය විවාහක ස්ත්‍රීයක වූව ද විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම සැලසීම වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පරිච්ඡින්න කොට අලුත් වගන්තියක් ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරන අතර, අලුත් වගන්තියේ නීතියේ බලපෑම වන්නේ සිවකීය ස්වාමිපුරුෂයාගේ අවෑමෙන් පසු විශ්‍රාම වැටපක් ලබමින් සිටින වැන්දඹුවක නැවත විවාහ වූ විටක එකී විශ්‍රාම වැටුපෙන් භාගයක් ලැබීමටත්, යම් හෙයකින් එකී නැවත විවාහක අවලංගු වූ විටකදී වුව ද, එහි කොටසක් නොවන ලෙසටත් එකී දෙවන විවාහය නිසා ඇයට අහිමි වූ කොටස පළමු විවාහයේ දරුවන්ට ලැබීමටත් විධිවිධාන සැලසීම වේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියට අලුත් උපවගන්තියක් එකතු කරන අතර එකී අලුත් උපවගන්තියේ නීතියේ බලපෑම වන්නේ විශ්‍රාම ගැනීමේ නියමිත දින සිට පෙර ධුරය අහෝසි කිරීම මත රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලබන සහ අරමුදලට දායක මුදල් ගෙවීම නතර කරනු ලැබූ රජයේ නිලධරයකුහට විශ්‍රාමයාමේ දිනයෙන් පසු ඔහු විසින් ඇතුළත් වන විවාහයක් සම්බන්ධයෙන් දායක මුදල් ගෙවීම ආරම්භ කිරීමට සැලසීම වේ.

***7 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ වන වගන්තිය පරිච්ඡින්න කොට ඒ වෙනුවට අලුත් වගන්තියක් ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරන අතර, සංශෝධනයේ නීතියේ බලපෑම වන්නේ, නියමිත දින හෝ ඊට පසු දායකයකු වන රජයේ නලධරයකු වසර දහයක් හෝ ඊට වැඩි කාලයක් සේවය සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම වැටුපකට හිමිකම නොලබා රජයේ සේවය හැර ගිය විටක, ඔහුගේ මරණින් පසු ඔහු විසින් අරමුදලට ගෙවන ලද දායක මුදල් මත පදනම් වූ විශ්‍රාම වැටුපකට ඔහුගේ වැන්දඹුව සහ දරුවන්ට හිමිකම ලබාදීම වේ.

***8 වන වගන්තිය*** : මේ වගන්තිය මගින්

(අ) අරමුදලේ දායකයකු වූ රජයේ නිලධරයකු මේ පනතේ 27අ වගන්තියේ () වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් අවස්ථානුගත හේතුමත මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර මියගිය විටක ඔහුගේ වැන්දඹුව හා දරුවන්ට එකී (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වීමට සලසනු ලබයි සහ

(ආ) රජයේ සේවයේ තාවකාලික හෝ අනියම් සේවකයකු ලෙස ධුර දරමින් සිට සේවයේ සිටියදීම, මේ පනතේ 27අ වගන්තියේ (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් අවස්ථානුගත හේතුමත, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර මියගිය විටක, ඔහුගේ වැන්දඹුවට හා දරුවන්ට එකී (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වීමට සලසනු ලබයි.

***9 වන වගන්තිය*** : මේ වගන්තිය මේ පනතේ 8 වන වගන්තියේ කරන ලද සංශෝධනයට ආනුශංගික වේ.

***10 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් මේ පනතේ 5, 6 සහ 7 වන වගන්තිවල විධිවිධාන අතීතයට බලපෑමට සලසනු ලබන්නේ ය.